14 පිටුවෙන් (අදිසි)

මට මා ගැනම පුදුම හිතෙන්නෙ මේව දැන දැනත් මං ඒ තරම් කාලයක් ඒ ගෙදර හිටිය එක ගැන.."

"දැං ඕව අමතක කරල දාන්න.. ආපස්සට කල්පනා කරලා හිත රිදවාගන්න එකේ තේරුමක් නැහැ.."

"මට අයේෂ ගැන දුකයි.. එයා මෝඩ කෙල්ලෙක්.. ඒකයි මේව මෙහෙම වුණේ.."

"මේව මෙහෙම වෙන්නෙ ඒ නිසා නෙවෙයි... තනි මිනිස්සු අතේ අසීමිත ලෙස බලය ගොඩ ගහන මේ දේශපාලන ක්‍රමේ වැරැද්දෙන්... පාලන ව්‍යුහයේ ඉහළන්ම වැජඹෙන්න දූෂිතයන්ට ඉඩ ලබා දෙන මේ ක්‍රමයේ වැරැද්දෙන්.. තමන්ට ආරෝපනය වුණ බලයේ මහිමයෙන් ඕනෙම පාදඩ වැඩක් කරලා ගැලවෙන්න පුලුවන්ය කියන මානසිකත්වයක් උන්ට ලබා දෙන මේ මජර ක්‍රමයේ වරදින්"

බණ්ඩාර ඇතුළු කොල්ලන්ගේ ජය සෝෂාව දාහතේ වත්තේ දෙකෙළවරට ම ඇසෙන තරම් විශාල ය. පාර්ලිමේන්තු ආසන තිස් නවයක් සහ බෝනස් ආසන දෙකක් යනු කිසි දිනෙක නොසිතූ තරමේ මහා ජයග්‍රහණයකි.

සෝමදාස ගේ මාලු ලෑල්ල අසළ සිටම පෙළපාලියේ පෙරමුණ බණ්ඩාරට ය. රට ගොඩ නැගීම කෙසේ වෙතත් දාහතේ වත්තේ දැවෙන අවශ්‍යතා සියල්ල වහා සම්පූර්ණ කරන්නට දැන් ඉතින් තමන්ට හැකියාව ලැබෙනු ඇතැයි බණ්ඩාර සිතයි. පාරවල් තාර දමන්නට, පොදු වැසිකිළිය පිළිසකර කරන්නට, ළමා ක්‍රීඩාංගනය නැවත ගොඩ නගන්නට.. අවුරුද්ද තිස්සේම උතුරා ගඳ ගසන කාණු සිමෙන්තියෙන් නැවත බඳින්නට.. මේ සියල්ලෙන් පසු සමෘද්ධිමත් ලංකාවක් බිහි කරන්නට මේ රජය මෙහෙයවන්නට තමන්ට හැකියාව ලැබෙනු ඇති බව නිසැක ය.

සුනන්ද ගේ නිවස ඉදිරියේ ඔහුගේ වාහනය නවතා ඇත.

"සුනන්දයියා.." බණ්ඩාර කඩුල්ල අසළ සිටම කෑගසන්නේ සතුට වැඩි කමට ය. "..ඔන්න මෙදා පොටේ අපි දුන්නා බැටේ... අන්තිමේ ගත්තෙ නැද්ද අපි රිමෝට් කන්ට්‍රෝල් එක...?"

"නියමයි මල්ලිලා.. දැන් ඉතින් සමාජවාදෙට යන ගමන හරිම ලේසියි නේද..? ගියපාර දෙකයි.. මේ පාර හතළිස් එකයි.. තව ටිකයි.. ඊළඟ පාර සමාජවාදී ශ්‍රී ලංකාවේ ඒළිපත්ත ළඟ තමයි නතරවෙන්නෙ.." සුනන්ද මිදුලට කර පොවා කියයි.

සුනන්දගේ කතාවට බණ්ඩාර කෝප නොගනියි. ඔහු සිය නඩයද සමගින් පටු මාවත ඔස්සේ ඉදිරියට යන්නේ ජයග්‍රහණයේ පණිවුඩය හැකි තරම් අයට බෙදා දෙන්නට ය.

"ඔයා එහෙම කිව්ව එක හොඳ නැහැ.." වින්ධ්‍යා කියන්නේ සුනන්ද සාලයට ගොඩ වන අතර ය. සුනන්ද පිලිතුරක් දෙන්නට පෙර ඕ සිය අත වූ තේ කෝප්පය ඔහුට දෙයි. "..ඒ මිනිස්සු ලැබුවෙ ලොකු ජයග්‍රහණයක්... මේ හොරු රැළ අතරේ ඉන්න අවංක මිනිස්සු ඒ අයයි කියලා මහජනතාව අඳුරගෙන තියෙනවා.. ඒකයි තෝරලා බේරලා ඒ අයටම මනාප ගහලා තියෙන්නෙ.. තමන් සමාජවාදය වෙනුවෙන් මේ ඡන්දෙට එනවා කියලා එයාල කොහෙදිවත් කිව්වෙ නැහැනෙ.. මේ පවතින ක්‍රමය තුළම එයාලට යමක් කරන්න බැරිවෙන එකක් නැහැ.."

සුනන්ද වින්ධ්‍යා දෙස බලා සිටින්නෙ සිනා මුවින් ය. "සෑහෙන්න දියුණුයි නෙ.. බලාගෙන යනකොට දාහතේ වත්තට ආවාම හැමෝගෙම ප්‍රඥාව දියුණු වෙනවා කියන කතාව බොරු නෙවෙයිනෙ.."

"කව්ද එහෙම කියන්නෙ..?"

"මම.."

"පිස්සා..."

*මීළඟ කළාපයට*

A.B.N - 399 885 484 25
SRI WRECK
TOWING




❖ VEHICLE TRANSPORT ❖
❖ BREAKDOWNS ❖
❖ FREE OLD CAR REMOVALS ❖
❖ RELIABLE RATES ❖
❖ TILT TRAY TRUCK ❖
❖ ALL AREAS ❖

24 HOURS 7 DAYS A WEEK

0433495548

udesha@bigpond.com 59956105

LANKAN AUTO CARE
Licensed Roadworthy Tester (R.W.C)



ALL MECHANICAL REPAIRS
LOG BOOK SERVICE | ELECTRICAL REPAIRS
AUTO TRANSMISSIONS | BRAKES & CLUTCHES
FUEL INJECTION | COMPUTER DIAGNOSTIC




Ranjith Perera
Mob: 0409 866 886

9798 2200
14/30 Tower Court
Noble Park 3174

Victoria Mercantile
LAWYERS

⇒ Advice On Legal Matters
⇒ Motor Vehicle Accident Claims
⇒ Debt Recovery & Enforcement

Anne Heenatimulla LLM (Monash)
Barrister & Solicitor
Attorney-at-Law (Sri Lanka)

Phone: (03) 8787 8590
Fax: (03) 9015 6724
Mobile: 0401 684 689
Email: VMLawyers@y7mail.com
Address: 10 Yellowbox Crescent, Lyndhurst VIC 3975






